# ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 6 දරන මෝටර් ගමනාගමන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1972 ඔක්තෝබර් මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1972 නොවැම්බර් මස 3 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

# ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 6 දරන මෝටර් ගමනාගමන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1972 ඔක්තෝබර් මස 23 වන දින]

එල්.ඩී.—ඕ. 22/71.

**1957 අංක 48 දරන මෝටර් ගමනාගමන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 6 දරන මෝටර් ගමනාගමන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

**2.** මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1957 අංක 48 දරන මෝටර් ගමනාගමන පනතෙහි 52 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *1957 අංක 48 දරන මෝටර් ගමනාගමන පනතෙහි 52 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(1) ඒ වගන්තියෙහි (1961 අංක 22 දරන පනතින් එහි ඇතුළත් කරනු ලැබූ) (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියෙහි (4) වන උපවගන්තිය ඒ වගන්තියෙහි (3) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන්.

**3.** මේ පනතෙහි 2 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියෙහි කරනු ලබන සංශෝධන ප්‍රධාන ප්‍රඥප්තිය වලංගු වූ දිනයෙහි ක්‍රියාත්මක වී ඇතැයි සියලු කාර්යයන් සඳහා සැලකිය යුතු ය. *සංශෝධනය අතීතයටත් බලපෑම.*